# සංඝික දානයක් දෙනවිට

පොකුණුවිට, ශ්‍රී විනයාලංකාරාරාම වාසී,
**පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේ**

**පුණ්‍යානුමෝදනාවයි**

විජයානන්ද මල්ලිකාරච්චි පියාණන්ට,
ගීතා ගනේවත්ත මෑණියන්ට
නිරෝගී සුව හා දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමින්
ප්‍රසාද් පද්මාල් මල්ලිකාරච්චි
තරුණ මහතා විසින් ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කර
ධර්ම දානය පිණිස බෙද දෙන ලදී.

**ධර්ම දානය පිණිසයි.**

බු:ව: 2554
ක්‍රි:ව: 2010

**පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේගේ**
**වෙනත් ධර්ම ග්‍රන්ථ**

සංඝික දානයක් දෙන විට
බුද්ධ පූජාවේ යථාර්ථය
බුද්ධ ප්‍රතිමාව සහ බෞද්ධකම
ද්වේශය දුරු කරන්නේ කෙසේද(ධර්ම දේශනාවක් ඇසුරින්)
දානය පාරමිතාවක් වන්නට නම් (ධර්ම දේශනාවක් ඇසුරින්)
සිතේ සැබෑව (ධර්ම දේශනාවක් ඇසුරින්)
නොනිමෙන මරණයේ නොමියෙන අරුත් (ධර්ම දේශනාවක් ඇසුරින්)
නැණස වසන නීවරණ (ධර්ම දේශනාවක් ඇසුරින්)
දානගෙන පිදිය යුතු කඨින චීවරය (ධර්ම දේශනාවක් ඇසුරින්)

**පරිගණක අක්ෂර සංයෝජනය**
කථිකාචාරිනී කමලා ගමගේ මෙනවිය.

පිටකවර නිර්මාණය
Maya
සාලිය ජයකොඩි
ග්‍රැෆික්ස් හොරණ - දුර : 0602-300999

**මුද්‍රණය:**
**සිකුරු ප්‍රකාශකයෝ**
144, වෙනිවැල්කොළ,
පොල්ගස්ඕවිට.
දුරකථන : 2704152, 2704832

## සංඝ - සංඝික

''සංඝ'' යන වචනය භික්ෂු සංඝ, භික්ෂුණී සංඝ, අරිය සංඝ, ශ්‍රාවක සංඝ යනුවෙන් ආකාර සතරකින් ව්‍යවහාර වේ. එයින් භික්ෂු සංඝ යනු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ භික්ෂූන් වහන්සේලාය. භික්ෂුණී සංඝ යනු බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ භික්ෂුණීන් වහන්සේලාය. අරිය සංඝ යනු බුදුරජාණන් වහන්සේගේ ගිහි පැවිදි ශ්‍රාවකයන් අතර සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත් වූ පිරිසය. මේ පිරිසම ශ්‍රාවක සංඝ යනුවෙන්ද හැඳින්වේ.

වර්තමානයේ සඟසතු දානයක් දෙනවිට මේ අතරින් ''භික්ෂු සංඝ'' පිරිස මුල් කරගෙන එම පිංකම් පැවැත්වේ. මෙහිදී ආර්ය වූද අනාර්ය වූද සියළු භික්ෂූන් වහන්සේලා අදහස් කෙරේ. ආර්ය භික්ෂූන් යනු සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ග ඵල සතරට පැමිණි භික්ෂු පිරිසයි. අනාර්ය භික්ෂූන් යනු එම ආර්ය භාවයට පැමිණීම පිණිස පිළිවෙත් පුරණ පෘථග්ජන භික්ෂු පිරිසයි. මේ දෙයාකාර වූ සියළු භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් දෙන දේ ''සාංඝික දානය'' - ''සඟසතු දානය'' යනුවෙන් හැඳින්වේ.

මෙහිදී මුල් වන්නේ පුද්ගල පිරිසක් නොව ගුණයම බව මැනවින් සිතට ගත යුතුය. පුද්ගල පිරිසකට දෙන්නේ නම් කිසිදාක අතීත පිරිසකට දිය නොහැක. අනාගත පිරිසට හා වර්තමානයේ සිටින සියළු දෙනාට

දීමද ඉතා දුෂ්කරය. සඟසතු දානයක් දීමේදී අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයේ සියළු භික්ෂූන්ට දියහැකි වන්නේ ඒ අයගේ ගුණයම මුල් කරගෙන දෙන නිසාය. බුදුරජාණන් වහන්සේ ජීවමානව නැතත් උන්වහන්සේගේ ගුණ සිහිකර පිදීමෙන් උන්වහන්සේට පිදූවා වෙයි. එයින් උපදින යහපත් සිතුවිලි පරම්පරාව නිසා උසස් කුශලයක්ද සිදුවේ. (''තිට්ඨන්තෙ නිබ්බුතෙ චාපි - සමෙ චිත්තේ සමං ඵලං'') අපි එය බුද්ධ පූජාමය කුශලය ලෙස හඳුන්වමු. එලෙසම දැනට නැති අතීත අනාගත භික්ෂූන් වහන්සේලාගේත්, වර්තමානයේ සියළු තැන විසිරී පවතින භික්ෂූන් වහන්සේලාගේත් ගුණය සිතින් අරමුණු කරගෙන පිදිය හැකි නම්, ඒ සියළු දෙනාට පිදූවා වෙයි. ඒ අනුව පහළ වෙන කුශල් සිතුවිලි සමූහයට ''සඟසතු දානමය කුශලය" යයි කියනු ලැබේ.

එහෙයින් සඟසතු දානයක් දීමේදී වැඩමවන භික්ෂූන් වහන්සේලාගේ ගණන කොපමණද යන්න ගැටළුවක් නොවේ. සියක් නමක් හමුවේ වුවද, එක් නමක් හමුවේ වුවද සඟසතු දානයක් දිය හැකිය. අවශ්‍ය වන්නේ කාරණය නිවැරදිව තේරුම් ගැනීම පමණි.

දානය සඟසතු කිරීම සඳහා උපසම්පදා භික්ෂූන් වහන්සේලා හතර නමක් හෝ පස් නමක් අවශ්‍ය බව ඇතැම් අයගේ මතයයි. ''සංඝ" යන්නට උපසම්පදා භික්ෂූන් හතර නමකට වැඩි පිරිසක් අවැසි වන්නේ භික්ෂූන් සම්බන්ධ විනය කර්ම වලදී පමණි. එය භික්ෂූන්ගේ කාර්යයකි. දානය සඟසතු කිරීම භික්ෂූවට අයත් කාර්යයක් හෝ විනය කර්මයක් හෝ නොවෙයි. එය දායකයාගේ වැඩකි. භික්ෂූන් වහන්සේලා වාක්‍යයක් කියවන්නේ



දායකයාට මග පෙන්වීම සඳහා පමණි. එහෙත් සඟසතු කිරීම හෝ නොකිරීම හෝ දායකයාගේ සිතුවිල්ල මතම සිදුවේ. ඒ අනුවම කුශලය අඩු වැඩි වීමද සිදුවේ.

දානය සඳහා භික්ෂූන් වහන්සේලා සියක් නමක් වැඩමවා ගත්තත්, මේ මේ භික්ෂූන් වහන්සේලාට දෙනවාය යන පෞද්ගලික දැන හැඳුනුම්කම් පමණක් සිහිපත් කරන්නේ නම් එය පෞද්ගලික දානයක් මිස සඟසතු දානයක් නොවේ. එමෙන්ම එක් භික්ෂූන් වහන්-සේ නමක් වැඩමවාගෙන වුවත් නිවැරදිව සඟ ගුණ සිහිකර ගතහොත් සඟසතුකොට දානය දිය හැකිය. එහෙයින් භික්ෂු පිරිසගේ ගණන කීයද යන්න හෝ පෞද්ගලික ගුණාගුණ කම් හෝ නොසලකා සංඝ ගුණ අරමුණු කරගෙනම පුදන්නට උත්සාහවත් විය යුතුය.

පෞද්ගලික වශයෙන් භික්ෂූන් වහන්සේලා තුළ කොතෙක් දූර්ගුණ තිබුණත්, එසේ සංඝ ගුණ සිහිකොට මහා සංඝ රත්නය වෙනුවෙන් පූජා කරන්නාවූ දායක-යාට අඩු පාඩුවක් නැතිව මහා කුශලයක් සිදුවන බව දිනක් බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට දෙසූහ.

**''භවිස්සන්ති ඛො පනානන්ද අනාගතමද්ධානං ගෝත්‍රභුනො කාසාවකණ්ඨා දුස්සීලා පාප ධම්මා. තෙසු දුස්සීලෙසු සංඝං උද්දිස්ස දානං දස්සන්ති. තදාපාහං ආනන්ද සංඝගතං දක්ඛිණං අසංඛෙය්‍යං අප්පමෙය්‍යන්ති වදාමි."** - ම.නි. දක්ඛිණා විභංග සූත්‍රය

''ආනන්ද, අනාගතයේ භික්ෂූන් පරිහානියට පත්වීම නිසා බෙල්ලේ කහ රෙදිකඩක් පමණක් බැඳගෙන

තමන් භික්ෂූන් වශයෙන් පෙනී සිටින, දුස්සීල වූ, පාප ක්‍රියාවන් කරන ''කාසාව කණ්ඨක'' නම් පිරිසක් ඇති වේ. මනුෂ්‍යයෝ භික්ෂු මහා සංඝ රත්නයට දෙනවාය යන හැඟීම ඇතිකරගෙන, ඒ දුස්සීලයන්ට දන් දෙති. ආනන්ද එකල්හි දෙන්නා වූ ඒ සඟසතු දානයද අසංඛ්‍ය වූ, අප්‍රමාණ වූ කුශල විපාක ඇතැයි මම දේශනා කරමි" යි බුදුරදුන් දෙසූහ.

## දානයට ආරාධනා කිරීම

තමන්ට සංඝික දානයක් දීමට අවශ්‍ය වූ විට භික්ෂූන් වැඩ සිටින විහාරස්ථානයකට, භාවනා ස්ථානයකට හෝ අරණ්‍ය සේනාසනයකට ගෙනගොස් පූජා කිරීමට වඩා තම නිවසට භික්ෂූන් වැඩමවා පූජා කිරීම දැනට බහුලව කෙරෙන චාරිත්‍රයයි. එහි වරදක් නැත. එහෙත් තමන්ගේ දැන හැඳුනුම්කම් මත අසවල් අසවල් භික්ෂූන් වහන්සේ අවශ්‍යය කියා තමන් විසින් නාම යෝජනා කොට ආරාධනා කිරීම, සංඝික දානයක් දීමේදී සුදුසු නැත. එසේ කළහොත් එතැන් සිටම ඇතිවන්නේ ඒ ඒ භික්ෂූන් වහන්සේ පිළිබඳව පෞද්ගලික හැඟීමය. එබඳු දානයක් පෞද්ගලික දානයක් විනා සඟසතු දානයක් වීමට ඉඩ අඩුය.

එමෙන්ම තම දැන හැඳුනුම්කම් මත දුර බැහැර සිටින භික්ෂූන් වහන්සේලාට ආරාධනා කිරීම නිසා දානය ටිකක් වැළඳීම සඳහා උන්වහන්සේලාට සමහරවිට සැතපුම් සිය ගණන් පවා යාමට සිදු වේ. එයින් උන්වහන්සේලාට වන්නේ මහත් පීඩාවකි. දවස පුරා කරන බණ භාවනා කටයුතු හෝ සමාජ සේවා කටයුතු



හෝ අඩාල වේ. කායික මානසික තෙහෙට්ටුව ඇති වේ. අඩු තරමින් වළඳන දානය මනාව දිරවා ගන්නටවත් අවශ්‍ය කායික පහසුව නැතිවී යයි.

එහෙයින් එවැනි ආරාධනාවක් සිදු කිරීම කුසල් වැඩීමට නොව කරගන්නා කුශලයත් පිරිහීමට හේතු විය හැකිය. එසේ දුර බැහැර වැඩ සිටින භික්ෂූන් වහන්සේලාට පූජා කළ යුතුම යයි හැඟේ නම් අවසර ගෙන වැඩ සිටින තැනකට ගෙනගොස් පිදීම වඩා යෝග්‍ය වේ.

සාමාන්‍යයෙන් සඟසතු දානයක් දීමේදී භික්ෂූන් වහන්සේලා ලබා ගැනීමට වඩාම යෝග්‍ය ක්‍රමය වන්-
න්, තමන් ඇසුරු කරන ආසන්නම විහාරස්ථානයට ගොස් ආරාධනා කිරීමයි. මෙහිදී තමන්ගේ නිවසේ ඉඩ කඩ තිබෙන ප්‍රමාණය, තමන්ට පහසුවෙන් උපස්ථාන කළහැකි ප්‍රමාණය සහ අවටින් පහසුවෙන් වැඩමවා ගතහැකි ප්‍රමාණය යන කරුණු සලකා බලා භික්ෂූන් ගණන තීරණය කරගත යුතුය. එසේ ගණන තීරණය කර, ''මහා සංඝ රත්නය වෙනුවෙන් මෙපමණ භික්ෂූන් වහන්සේලා වැඩමවා දෙන්න'' යයි බුලත් හුරුල්ලක් පිළිග න්වා එහි ප්‍රධාන ස්වාමීන් වහන්සේට ආරාධනා කිරීම සුදුසුය. එම විහාරස්ථානයෙන් හෝ අවට විහාරස්ථාන වලින් වැඩමවා ගතහැකි භික්ෂූන් වහන්සේලා ප්‍රමාණය තමන්ට තීරණය කරගත නොහැකි නම්, දානය සඳහා කොතෙක් භික්ෂූන් වහන්සේලා වැඩම කරවා දිය හැකි දැයි නායක ස්වාමීන් වහන්සේ සමඟ සාකච්ඡා කොට, දෙපසටම පහසු ආකාරයෙන් යොදා ගත යුතුය.

ඇතැම් කෙනෙක් ඉහත කරුණු කිසිවක් ගැන සැළකිලිමත් නොවී, වෙනත් කරුණු පදනම් කරගෙන

මෙපමණ භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ගත යුතු යයි තීරණය කරති. එහිදී බොහෝ විට මිය ගිය කෙනෙකුගේ ආයු ප්‍රමාණය, ජීවත්ව සිටින කෙනෙක් නම් දැනට ගතකර ඇති ආයු ප්‍රමාණය ආදිය සංකේතවත් කරමින් එපමණ භික්ෂූන් වහන්සේලා වැඩමවාගෙන, ඉඩකඩ මදි කමින් හා උපස්ථානය නිසි ලෙස කරගත නොහැකි වීමෙන් දෙපිරිසම මහත් අපහසුතාවයට පත් වෙති.

## දානය සැකසීම

දානපති, දාන සහායක, දාන දාස යයි දන් දීමේ ක්‍රම තුනකි. තමන් අනුභව කරනවාට වඩා උසස් අයුරින් දීම දානපති භාවයේ පිහිටා දීමයි. තමන් අනුභව කරනවා හා සමව දීම දාන සහායක භාවයේ පිහිටා දීමයි. තමන් අනුභව කරනවාට වඩා පහත් අයුරින් දීම දාන දාස භාවයේ පිහිටා දීමයි. මේ අතරින් සඟසතු දානය දානපති භාවයේ පිහිටා දීම බෞද්ධ කාගේත් සිරිතයි. එහිදී වඩාත් රසවත් ආකාරයෙන් සකසන්නට වෙහෙසෙනවාට වඩා කයට අපත්‍ය නොවන, ගුණාත්මක ආකාරයෙන් සකසන්නට උත්සාහවත් වන්නේ නම් එය කුශලය බලවත් වීමටද හේතුවකි. එමෙන්ම වළඳන්නාවූ භික්ෂූන් වහන්සේලාටද කරන මහා යහපතකි. ආහාර අනුභව කිරීමේ මූලික පරමාර්ථය, කුස ගිනි නිවා ගැනීමත් ආයුෂය, නීරෝගි බව හා කායික පහසුව පවත්වා ගැනීමත්, ගුණ නුවණ දියුණු කර ගැනීමත්ය. දන් දීමේදී එය ලබන තැනැත්තාට (ප්‍රතිග්‍රාහකයාට) මෙම මූලික අවශ්‍යතා සපිරෙන අයුරින් දෙන්නේ නම් එය ''සත්පුරුෂ දානයකි.'' ආහාර වඩා රසවත් කිරීමේ අදහසින්, ''කෘතිම රසකාරක'' ආදිය යෙදූවත් එයින් ආයුෂය මෙන්ම නීරෝගී බවත් පිරිහේ. දානමය කුශලයත් පිරිහේ.



දානය සකසනවාය, බත් ව්‍යඤ්ජන උයනවාය යන මේ දෙකෙහි ඇති වෙනස මැනවින් හඳුනා ගත යුතුය. දෙකේදීම ක්‍රියා පිළිවෙත එක සමානය. වෙනස ඇති වන්නේ සිතුවිලි වලය. එහෙයින් දානය සැකසීමේදී බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට පිදීම සඳහා සකසනවාය යන සිත නැවත නැවත මතු කර ගනිමින් හැකිතාක් බුදු ගුණ, සඟ ගුණ සිහි කරමින්ම කරන්නට උත්සාහවත් විය යුතුය. එසේ කිරීමෙන් කුශලය වඩාත් ප්‍රබල වේ.

සඟසතු දානයකදී අටපිරිකර හෝ වෙනත් පිරිකර හෝ පූජා කිරීමද බොහෝ දෙනා සිරිතක් වශයෙන් සිදු කරති. එහෙත් අටපිරිකරක් නැතහොත් සඟසතු දානයක් දිය නොහැකිය, අටපිරිකර අත්‍යාවශ්‍යය යන මතයෙහි සත්‍යයක් නැත. ආහාර පූජාව එකකි. පිරිකර පූජාව තවත් එකකි. මේ සියල්ල එකට හෝ වෙන වෙනම හෝ කිරීමෙහි වරදක් නැත. දානයකට මේ මේ දේ තිබිය යුතුමයයි කියා නියමයක් කොතැනකවත් නැත. එය තීරණය කළ යුත්තේ තමන්ගේ ආර්ථික ශක්තිය හා මානසික ශක්තිය මතය. (මෙහි මානසික ශක්තිය යනු පරිත්‍යාග කිරීමට මනසේ ඇති හැකියාවයි.)

## අසුන් පැනවීම

දානයට භික්ෂූන් වහන්සේලා වැඩම කළ පසු පැය එක හමාරක් හෝ දෙකක් පමණ කාලයක් වාඩිවී සිටීමට සිදුවන නිසා එම කාලය පහසුවෙන් වැඩ සිටීමට හැකිවන ආකාරයෙන් අසුන් පැනවීම ගැනද සැලකිලිමත් විය යුතුය. දානය සඳහා වැඩමවන භික්ෂූන් වහන්සේලාගේ ගණන තීරණ කිරීමේදී නිවසේ ඉඩ කඩ ගැන සැළකිලිමත් වන ලෙස මුලින් සඳහන් කළේ එහෙයිනි.

භික්ෂූන් වහන්සේලාට අසුන් පැනවීම ගැන තරමක් සැළකිලිමත් වුවත් බොහෝ දෙනා බුද්ධාසනය සැකසීම ගැන එතරම් සැළකිලිමත් නොවේ. එයද ඉතා ගෞරවයෙන් කළ යුතුය. දැනට සම්මත ක්‍රමය අනුව බුදුරජාණන් වහන්සේ වෙනුවට සධාතුක කරඬුව වැඩම වීම සිදු කරන නිසා එය තැන්පත් කර, කරඬුව ඉදිරිපස ආහාර පානාදිය අවහිරයකින් තොරව තැන්පත් කිරීමට ඉඩකඩ සැලසෙන අයුරින් ඉතා ගෞරවයෙන් බුද්ධාසනය සකස් කළ යුතුය. ඒ සඳහා විශේෂයෙන් සැකසූ අසුනක් විහාරස්ථානයේ වෙතොත් එය ගෙනැවිත් පිරුවට දමා සැකසීම කළ හැකිය. නැතහොත් සුදුසු පරිදි බුද්ධ ගෞරවය රැකෙන ලෙස අසුනක් සැකසිය යුතුය.

## භික්ෂූන් වහන්සේලා වැඩමවීම

වාහන පහසුකම් නැති ප්‍රදේශවල භික්ෂූන් වහන්සේලා පා ගමනින්ම වැඩම කළත්, වාහන පහසුකම් ඇති සමහර කෙනෙක් වාහන වලින්ම භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ගනිති. තමන්ගේ හැකියාව මත මේ කවර ක්‍රමයක් වුවත් යෝග්‍යය. එහෙත් වර්තමානයේ ඇතැම් කෙනෙක් වාහන පහසුකම් තිබියදීත් වාහනය පසු පසින් එන්නට සලස්වා භික්ෂූන් වහන්සේලා හේවිසි නාද මධ්‍යයේ පා ගමනින් වැඩම කරවති. එයින් බොහෝ දෙනෙක් සතුටු වේය, චිත්ත ප්‍රසාදය වැඩි වේය, නිවැරදි ක්‍රමය එයය, ගෞරවනීය ක්‍රමය එයය, බුදුරජාණන් වහන්සේ දෙසූ අල්පේච්ඡ ක්‍රමය එයය, ආදී නොයෙක් අදහස් මේ සම්බන්ධව බොහෝ දෙනා පවසති. ඒ සියළු අදහස් නිවැරදිය. එහෙත් මෙහිදී සැළකිය යුත්තේ දානයේ පරමාර්ථය ගැනය, ''දානයේ පරමාර්ථය තමන් සතු දෙයින් ප්‍රතිග්‍රාහකයාට (ලබන්නාට) යහපත සැලසීමයි."



අන්‍ය සියළු කරුණු මෙහිදී අප්‍රධානය. ප්‍රධාන කරුණ යටපත් කර අප්‍රධාන කරුණු වලට මුල්තැන දීම ක්‍රියාවේ ඵලය හීන වීමට හේතුවකි.

මෙයින් අදහස් කරන්නේ භික්ෂූන් වහන්සේලා පයින් වැඩමවීම නුසුදුසුය යන්නක් නොවේ. තමන්ට ඊට වඩා පහසුකම් සැලැස්විය නොහැකි නම් එය ඉතාම යෝග්‍ය ක්‍රමයයි. එහෙත් වාහන පහසුකම් තිබියදීත්, වාහනය පසුපස පැමිණෙද්දීත්, භික්ෂූන් වහන්සේලා පයින්ම වැඩමවන්නේ නම් එයින් කුශලය වැඩිවීම කෙසේ වෙතත් හීනවීම නම් සිදුවේ. මෙබඳු කරුණු පිළිබඳව ඉතා විමසිලිමත්ව, මැදහත්ව සිතිය යුතුය.

කුසල් සිදු කිරීමේදී අපට වරදින ප්‍රධානම තැන, කුසල් යයි සිතාගෙන අපි කැමති - අපේම හැඟීම් වලට යට වීමයි. එහිදී අපේම තෘෂ්ණාව, මානය වැනි හැඟීම් කුසල් සිතුවිලි සේ පෙනී සිටිමින් අපේ සිත මුලා කරයි. මෙබඳු හැඟීම් ''වඤ්චක ධර්ම'' යනුවෙන් හැඳින්වේ. වඤ්චක ධර්ම, අර්හත්වයට පැමිණෙන තෙක්ම ඒ ඒ තැනට සුදුසු අයුරින් ගිහි පැවිදි කාගෙත් සිත්වල මතුවී කුසලයට බාධා කරයි. එබඳු සිතුවිල්ලකින් අපේ සිත යට වූ විට එයම නිවැරදිය, එයම සත්‍යයයි අපට හැඟේ. එය මුලාවක් යයි අන් අය පැවසුවත් අපට එය නොවැටහේ. මෙසේ විවිධ මුහුණු වරින් පැමිණ අපේම සිත රවටන වඤ්චක ධර්ම පිළිබඳව ගිහි පැවිදි සියළු දෙනා යම් පමණක හෝ දැනුමක් ඇති කර ගැනීම ප්‍රයෝජනවත්ය. ඒ සඳහා රේරුකානේ මහ නාහිමිපාණන් වහන්සේ විසින් රචිත ''වඤ්චක ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම" පොත මහෝපකාරී වේ.

අතීතයේ මනුෂ්‍යයෝ බුදුරජාණන් වහන්සේ හෝ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් හේවිසි ආදී තූර්යනාද පැවැත්වූයේ අතිරේක ගෞරවයක් වශයෙනි. එහෙයින් බුද්ධ ප්‍රමුඛ භික්ෂු මහා සංඝරත්නයට ගෞරවයක් වශයෙන් පූජාවක් වශයෙන් හේවිසි ආදී තූර්ය නාද පැවැත්විය හැකි නම් එය මහා කුසලයකි. නමුත් එය භික්ෂූන් වහන්සේලා පයින් ගෙන්වා ගන්නා උපායක් හෝ තමන් මහ පිංකමක් කරන බව ගමේ අයට පෙන්වීමේ උපායක් හෝ නොවිය යුතුය.

## පා ධෝවනය

අතීතයේ භික්ෂූන් වහන්සේලා පා ගමනින්ම වැඩම කළ නිසා ආවාසයට ඇතුළු වන විටත්, ගෙදරකට ඇතුළු වන විටත් පා ධෝවනය කිරීම අවශ්‍යතාවයක් විය. වර්තමානයේ එය එතරම්ම අවශ්‍ය නොවුණත් ගෞරවනීය චාරිත්‍රයක් වශයෙක් සිදු කරති. එයද ''වෙය-යාවච්ච" (වතාවත් කිරීම) නම් වූ මහා කුසලයකි.

එහෙත් සමහරු මෙය නිකම්ම චාරිත්‍රයක් සේ සලකා නොසැළකිලිමත්ව සිදු කරති. ඇතැම් විට දිය බිඳු කිහිපයක් දෙපයට ඉසීම හෝ දෙපයේ ඇතිල්ලීම හෝ සිදු කරති. එයින් වන්නේ භික්ෂූන් වහන්සේලාගේ පාදවල ඇති දූවිලි වලට ජලය මුසුවීමෙන් එලා ඇති පාවඩ මත මඩ පැල්ලම් ඇති වීම පමණි. එය දකින කිසිවෙකුට ප්‍රසන්න දර්ශනයක් නොවේ. එයින් වළකින්නට ඇතැම් භික්ෂූන් වහන්සේ කෙනෙක් පා සේදීමෙන් මඟ හැරීමට උත්සාහවත් වෙති. එයින්ද දායකයෝ කළකිරෙති. එහෙයින් පා ධෝවනය කරනවිට පාදවල දූවිලි මඩ ආදිය බැහැරවන ලෙස හොඳින් ජලය වත්කර දෑතින්ම



සෝදන්නේ නම්, එය කුසලයක් මෙන්ම ප්‍රඥ ගෝචර උපස්ථානයක්ද වේ.

## බුද්ධ පූජාව

භික්ෂූන් වහන්සේලාට දානය පූජා කිරීමට පළමුව බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ධාතු කරඬුව ඉදිරිපිට දානය තැන්පත් කර බුද්ධ පූජාව සිදු කෙරේ. ජීවමාන බුදුරජාණන් වහන්සේට පූජා කරනවා හා සමාන ගෞරවනීය සිතකින් බුදු ගුණ සිහිකොට පුදන්නේ නම් මෙය මහා කුශලයකි. එහෙත් මේ හැඟීම මතුකර ගැනීම පහසු නොවේ. දානය සම්බන්ධ වැඩ කටයුතු කල්වේලා ඇතිව නිමවා සිත නිදහස් කර ගැනීම මේ සඳහා ඉතා අවශ්‍යය.

එමෙන්ම කෙනෙකුට කුසගිනි නිවා ගන්නට ප්‍රමාණවත් තරමට ආහාරපානාදිය සුදුසු භාජන වලට සකසා ගැනීම ගැනද සැළකිලිමත් විය යුතුය. කුඩා බඳුන් වලට ආහාරපාන ස්වල්පයක් බෙදා පූජා කිරීම, ජීවමාන බුදුරදුන්ට පුදනවා වැනි ගෞරවනීය සිතක් ඇති කර ගැනීමට බාධාවක් විය හැකිය.

භික්ෂූන් වහන්සේලා දන් වළඳා අවසන් වන වේලාව පැමිණෙද්දී ඉතා ගෞරවයෙන් වැඳ අවසර ගෙන, බුද්ධ පූජාව ඉවත් කොට භාජන සෝදා තැබීම ගැනද අවධානය යොමු කිරීම අවශ්‍යය. එම භාජන තමන්ගේ වුවත් විහාරස්ථානයෙන් ගෙනෙන ලද ඒවා වුවත් ගෞරවයෙන්ම සෝදා පිරිසිදු කළ යුතුය.

භික්ෂූන් වහන්සේලාට පරිෂ්කාර පූජා කරන නිසා බුදුරජාණන් වහන්සේටත් පිරිකරක් පූජා කළ යුතුයයි බොහෝ දෙනා සිතුවත් එය නිවැරදිව කෙරෙන බවක්

නොපෙනේ. බොහෝ දෙනා ඒ වෙනුවෙන් යොදා ගන්නේ ධාතු කරඬුව වැසිය හැකි ලේන්සුවකි. මෙය බුදුරජාණන් වහන්සේට පුදනවා යන්න අමතක කොට කරඬුවට පුදනවා යන සිතුවිල්ල මතුවීම නිසා ඇතිවන පටලැවිල්ලකි. බුදුරජාණන් වහන්සේට පුදනවා යන නිවැරදි සිතුවිල්ල මතුකර ගෙන පුදන්නේ නම් ලේන්සුවක් පූජා කළත් එය වරදක් නොවේ. එහෙත් බෞද්ධ කොඩියක් වැනි දෙයක් පූජා කරන්නේ නම් එය ඒ වෙලාවට පමණක් නොව සියළු කල්හි බුද්ධ පූජාවක් ලෙස විහාරස්ථානයේ පරිහරණය කළ හැකිය. පූජා කිරීමට සුදුසු අන් ඕනෑම පරිෂ්කාරයක් බුදුරජාණන් වහන්සේට පූජා කිරීමද යෝග්‍යය.

## සඟසතු කිරීම

දානය සඟසතු කොට මහා සංඝරත්නයට පොදුවේ පූජා කිරීම හෝ පෞද්ගලිකව පූජා කිරීම දායකයාගේ සිතුවිල්ල මත සිදුවන බව මුලින් සඳහන් කළෙමු. භික්ෂූන් වහන්සේලා විසින් කරන්නේ සඟ ගුණ සිහි කරගෙන පූජා කරන්නට දායකයාට කරුණු පැහැදිලි කර දීම හා වාක්‍යයක් කියවීමෙන් වඩාත් එය තහවුරු කිරීමයි.

පංචශීලය සමාදන් කරවීමේදී, භික්ෂූන් වහන්සේ ශික්ෂාපද කියවූ පසු ගිහියන් විසින් ද කියවනු ලබයි. එහෙත් එයින් භික්ෂූන් වහන්සේලා පංච ශීලය සමාදන් වූ බවක් නොකියවේ. උන්වහන්සේ කළේ ගිහියාට එහි පිහිටන්නට මඟ පෙන්වීම පමණි. ගිහියා භික්ෂූව කියන නිසා කියවූ පමණින්ම පංචශීලය සමාදන්වීම සිදු නොවේ. මැනවින් අර්ථ දැනගෙන මනසින් එහි පිහිටිය



හොත් පංචශීලය සමාදන් වූවා වෙයි. ඒ ආකාරයෙන්ම දානය සඟසතු කිරීමේදීත් භික්ෂූන් වහන්සේලා කරන්නේ දායකයාට මග පෙන්වීම පමණි. මැනවින් සිත සකසාගෙන පිදුවොත් පමණක් දායකයාගේ කුශලය සම්පූර්ණ වේ.

එහෙයින් අතීත වර්තමාන අනාගත යන සියළු කාලයට අයත් ආර්ය වූද අනාර්ය වූද භික්ෂූන් වහන්සේලා සිතින් අරමුණු, කරමින් පෘථග්ජන සිල්වත් භික්ෂුවගේ පටන් මහ රහතන් වහන්සේ දක්වා තමන් දන්නා පමණින් ගුණ සිහි කරගෙන, ඒ සියළු දෙනා වහන්සේගේ අනන්ත ගුණය වෙනුවෙන් පුදනවාය යන සිත මතුකරගෙන පූජා කළ යුතුය. ''මේ දානය වළඳන ස්වාමීන් වහන්සේලාත් මේ ආහාරපානාදියෙන් සවිය වඩවාගෙන තමන්ගේ ශ්‍රමණ ධර්මයන් පූර්ණ කර ගනිමින් බොහෝ කාලයක් සසුන සුරකිත්වා!'' යන මෛත්‍රී සිත ඇති කර ගෙන පූජා කළ යුතුය.

## දන් බෙදන පිළිවෙල

දානය බේදීම මෙසේ මෙසේ කළ යුතු යැයි විශේෂ ක්‍රමයක් දැක්විය නොහැකිය. දහවල් ඉර අවරට යන්නට පෙර දන් වළඳා අවසන් කරන්නට කාල වේලාව ඇතිව, පහසුවෙන් වැළඳිය හැකිවන ලෙස දන් බේදීම කළ යුතුය. මෙහිදී කාල වේලාව ගැනද දැනුවත් විය යුතුය. සාමාන්‍යයෙන් ඉර අවරට යාම වර්තමාන වේලාවෙන් දහවල් 12 ට පමණ සිදුවේ. (මෙය දිනපතා අඩු වැඩි වේ.)

බත් ව්‍යඤ්ජන මෙසේ බේදිය යුතුය, අතුරු පස මෙසේ අනුපිළිවෙලින් පිළිගැන්විය යුතු යයි ඒ ඒ ප්‍රදේශවල යම් සම්මුතියක් ඇතොත්, එය සුදුසුනම් අනුග

මනය කළ හැකිය. දානයට වඩින භික්ෂූන් වහන්සේලා ගේ යම් සම්මත ක්‍රමයක් වෙතොත් ඒ පිළිබඳව කල් ඇතිව විමසා දැන ගැනීම සුදුසුය. එසේත් නැතහොත් තමන් සුදුසු යයි සිතන පිළිවෙළක් වේ නම්, කල් ඇතිව ඒ පිළිබඳව අන් අය දැනුවත් කර තිබීම ප්‍රයෝජනවත් වේ. එසේ නැතහොත් දන් බෙදද්දී ඔවුනොවුන්ගේ මත ගැටුම් ආදියෙන් ඇතිවන චිත්ත විස්සෝපය නිසා කුසලය හීන වේ. කිරි, පළතුරු, සුප් වර්ග, තේ, කෝපි ආදිය බන්දේසිවල තබා ගිහියන්ට මෙන් අල්ලාගෙන යාම දන් බේදීමේදී කරන වරදකි. කෙනෙක් බන්දේසිය අල්ලාගෙන සිටිද්දී අනෙකකු විසින් ඒවා එකින් එක ගෙන භික්ෂූන් අතට පිළිගැන්වීම, භික්ෂූන්ට ගැලපෙන විනයානුකූල ක්‍රමයයි.

## පිරිකර පූජාව

සඟසතුකොට පූජා කළ පසු ඒ සියල්ල භික්ෂූන් වහන්සේලා සතුය. මහා සංඝ රත්නය වෙනුවෙන් ලැබුණු දේ එතැනට රැස් වූ භික්ෂූන් වහන්සේලා අතර සමසේ බෙදා ගත යුතු යයි බුදුරජාණන් වහන්සේ පනවා ඇති නිසා එහි ඇති පරිෂ්කාර ආදිය එතැනට රැස් වූ භික්ෂූන් වහන්සේලාගේ අයිතිය මත පවතී. ඒවා තමන් කැමති ලෙස සංවිධානය කිරීමට දායකයාට අයිතියක් නැත. (එසේ කැමති කැමති භික්ෂූන් වහන්සේලාට පිදමට අවශ්‍ය නම් සඟසතු නොකොට වෙන්ව තබාගෙන පසුව පිදිය යුතුය.)

ඇඳ, පුටු, මේස, කොට්ට, මෙට්ට, ලෝහමය හැලි ආදී ගරු භාණ්ඩ ලෙස සැලකෙන පිරිකර වෙතොත් ඒවා නොබෙදිය හැකිය. ඒ සියල්ල භික්ෂූන් වහන්සේලා



වැඩම කළ විහාරස්ථානයට ගෙනගොස් දිය යුතුය. එහි නායක ස්වාමීන් වහන්සේ ඇතුළු භික්ෂූන් කැමති නම් අන් විහාරස්ථානයකට දිය හැකිය.

අටපිරිකර ගරු භාණ්ඩවලට ඇතුලත් වන පිරිකර නොවුණත්, විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ වෙත හෝ උන් වහන්සේ අනුමත කරන අන්‍ය ස්වාමීන් වහන්සේ නමකට හෝ ලැබීම සාමාන්‍යයෙන් දැනට පවතින චාරිත්‍රයයි.

වෙනත් අටපිරිකර හෝ අවශේෂ පිරිකර ඇතොත් ඒවා අන්‍ය භික්ෂූන් වහන්සේලා අතර බෙදා දිය යුතු වුවත් එය භික්ෂූන් වහන්සේලාගේ අනුමැතියකින් තොරව නොකළ යුතුය. භික්ෂූන් වහන්සේලා විසින් පිරිකර පූජා කරන්න යයි නියම කළ පසුව හෝ තමන්ම අවසර ගෙන හෝ එය කිරීම යෝග්‍යය.

සියල්ල මහා සංඝ රත්නයට කල් ඇතිව පූජා කළත්, තමන්ගේ අතින් පිරිකර පූජා කරන්නට බොහෝ දෙනෙක් වෙහෙසෙති. එය අත්‍යාවශ්‍ය දෙයක් නොවේ. සඟසතු කොට පුදනවාත් සමඟම කුසලය සිදුවී අවසානය. එහෙත් වැඩි චිත්තප්‍රසාදය සඳහා එසේ සියතින්ම ගෙන පිළිගැන්වීම අවශ්‍ය නම් ඉහත සඳහන් පරිදි භික්ෂූන් වහන්සේලාගේ අනුමැතිය ගෙන එසේ කිරීම වරදක් නොවේ. එහෙත් එය අතිරේක කාර්යයක් බව මතක තබා ගැනීම වැදගත් වේ.

## පුණ්‍යානුමෝදනාව

පුණ්‍යානුමෝදනාව කරන අවස්ථාව පිංකමක ඉතා

විශේෂ අවස්ථාවකි. අනෙක් අවස්ථාවලදී යම් යම් හේතු නිසා කුසල් සිතට බාධා පැමිණුනත්, මේ අවස්ථාවේදී නැවත මුල පටන් ආවර්ජනා කොට සිත සකසාගෙන අනුමෝදන් වීම කළ හැකිය. එහෙත් පරිෂ්කාර පූජා කර අවසන් වූ පසු සියල්ල නිම වූවා යන හැඟීමෙන් පුණ්‍යානුමෝදනාව පිළිබඳව බොහෝ දෙනා සිතින් පසු බට වෙති. එහෙයින් එතෙක් පැවති චිත්ත ප්‍රබෝධය අහෝසි වී උදාසීන වූ තෙහෙට්ටු වූ ස්වභාවයක් පමණක් මෙහිදී දක්නට ලැබේ. ඇතැම් කෙනෙක් මෙතැනට කුඩා දරුවන්ද රැගෙනවිත්, ඒ දරුවන්ගේ කෙලි සෙල්ලම් ගැන සිත යොදවති. ඇතැම් කෙනෙක් පැමිණි අමුත්තන්ට සංග්‍රහ කිරීමෙහි උත්සුක වෙති. මෙබඳු දේ නිසා පිංකමේ ඉතා වටිනා අවස්ථාවක් තමන්ගෙන් ගිලිහී යයි.

එසේ නොකොට එතෙක් කටයුතු කළාක් මෙන් පුණ්‍යානුමෝදනා කරන කාලය තුළත් හැකිතාක් ප්‍රබෝධයෙන් සහ සතුටින් මෙතෙක් කළාවූ පිංකම් සිතින් ආවර්ජනා කර පිං අනුමෝදන් වීම කළ යුතුය.

## භික්ෂූන් වහන්සේලා ආපසු වැඩමවීම

සාධුකාර, හේවිසි නාද මධ්‍යයේ ධාතු කරඬුව හා භික්ෂූන් වහන්සේලා නිවසට වැඩමවාගෙන ආවත් ආපසු වැඩමවීමේදී බොහෝ තැන්වල එබඳු දේ දක්නට නැත. තමන්ගේ කාර්යය නිම වූ පසු ඉතිරිය නොසලකා හැරීම ප්‍රබල ක්ලේශයකි. එම ක්ලේශයෙන් කුසලය හීන වන්නට ඉඩ නොදී මුලින් නිවසට වැඩමවීමේදී දැක්වූ ආකාරයෙන්ම ගරුසරු දක්වමින් ධාතු කරඬුව පෙරටු කොට භික්ෂූන් වහන්සේලා ආපසු වැඩමවීමද සිදු කිරීමෙන් කුසලය පරිපූර්ණ වේ.



## සඟසතු ආහාර වලට කළ යුත්ත

සඟසතු කොට පූජා කළ බත් ව්‍යඤ්ජන ආදිය ඉතිරිව තිබුණත්, ඉර අවරට ගිය පසු, භික්ෂූන් වහන්සේලාට ඉන්ප්‍රයෝජනයක් නොවේ. ඒවා පසු දින ප්‍රයෝජනයට ද නොගත හැකිය. එහෙයින් භික්ෂූන්ගේ අවසරය ඇතිව එම ආහාර ගිහියන්ගේ ප්‍රයෝජනය සඳහා ගැනීම වරදක් නොවේ. නිවසක නම්, සඟසතු කිරීම සඳහා බත් ව්‍යඤ්ජන කොටසක් පමණක් වෙන් කර තබන බැවින් එබඳු ගැටළු මතු නොවේ.

අතුරු පස ආදියෙහි යමක් පසුදින ප්‍රයෝජනය සඳහා හෝ ගිලන්පස සඳහා හෝ ගතහැකි නම්, ඒවා භික්ෂූන් වහන්සේලාගෙන් විමසා බලා විහාරස්ථානයට යැවිය යුතුය. ඒවාත් ගිහියන්ගේ ප්‍රයෝජනයට ගන්න යයි භික්ෂූන් වහන්සේලා අවසර දුන්නොත්, තමන්ගේ ප්‍රයෝජනයට ගැනීමෙහි වරදක් නැත.